# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 287 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 17/02/2024 පැය 1405

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - දඹුල්ල පොලිස් වසම.

2024.02.17 වන අද දින උදෑසන කාලයේ දඹුල්ල පොලිස් වසමේ ත්‍රිකුණාමලය අඔේපුස්ස මාර්ගයේ පැල්වැහැර ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට කොළඹ දෙසට ධාවනය කරමින් තිබූ මෝටර් රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී පදිකයා බරපතල තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වන නාවුල පෙනෙලගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන් වීමක් - කරාඩුගල පොලිස් වසම.

2024.02.16 වන දින උදෑසන කාලයේ කරාඩුගල පොලිස් වසමේ පිහිඹියාව ප්‍රදේශයේ පිහිටි ගලඔයේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන් වී ඇති බවට බිබිල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත කරාඩුගල පොලිසිය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ අය වයස අවුරුදු 53 වන බිබිල අඩවි වන කාර්යාලයට අයත් ක්ෂේත්‍ර නිලධාරියෙකි.**

බිබිල අඩවි වන නිලධාරී කාර්යාලයේ නිලධාරීන් කණ්ඩායමක් පිහිඹියාව ප්‍රදේශයේ වැටලීම් රාජකාරියක් සඳහා ගොස් සිටියදී මෙම අනතුරට පත්ව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. අතුරුදහන් වූ අය සොයා පොලිසිය හා නාවික හමුදාව මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත. කරාඩුගල පොලිසිය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**